(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

අංක 1(1).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2024 පෙබරවාරි 16 සිකුරාදා

**2024 මාර්තු 05 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1/2024

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අකුරණ ප්‍රදේශවාසීන් විසින් කැළි කසල, අබලි ගොඩනැඟිලි ද්‍රව්‍ය, හිස් ටින්, ප්ලාස්ටික් බෝතල්, මළ අපද්‍රව්‍ය අකුරණ නගරය හරහා ගලා යන පිහා ඔයට දැමීම නිරතුරුවම සිදු කරනු ලබන බවත්;

(ii) එසේම එම ඔයේ ඉවුරු දෙපස අනවසරයෙන් ගොඩනැඟිලි ඉදිකරනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)හි සඳහන් හේතු නිසා වර්ෂා කාලයේදී ගංවතුර ඇති වීමේ අවදානම හා මහවැලි ගඟට දූෂිත අපද්‍රව්‍ය එකතු වීම සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා වාර්තා ලබා ගෙන තිබේද;

(ii) පිහා ඔය දෙපස ඉදිකර ඇති අනවසර ගොඩනැඟිලි සංඛ්‍යාව කොපමණද;

(iii) එයට කැළි කසල හා අපද්‍රව්‍ය බැහැර කරන පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා සහ එම ඔය දෙපස ඉදිකර ඇති අනවසර ගොඩනැඟිලි ඉවත් කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් තිබේද;

(iv) මේ වනවිට පිහා ඔයේ ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා පියවර ගෙන තිබේද;

(v) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

41/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1948.02.04 දිනෙන් පසුව මරණ දඬුවම නියම කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ එල්ලා මරණයට පත් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එල්ලා මරණයට පත් කරන පුද්ගලයින්ගේ මරණ සහතික ඥාතීන් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හිටපු අග්‍රාමාත්‍ය ගරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා ඝාතනය කිරීම සම්බන්ධයෙන් වැරදිකරු වූ තල්දූවේ සෝමාරාම හිමියන්ගේ මරණ සහතිකය මෙතෙක් නිකුත් කර නොමැති බවත්;

(ii) 1962.07.06 දින තල්දූවේ සෝමරාම හිමි එල්ලා මැරූ බවට සඳහන් වුවද එදිනට එම නමින් මරණයක් ලියාපදිංචි වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) තල්දූවේ සෝමරාම හිමියන්ගේ මරණ සහතිකය නිකුත් නොකිරීම පිළිබඳ පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එහි නිගමනය කවරේද;

(iii) නොඑසේ නම්, පරීක්ෂණයක් සිදු කරන්නේද;

(iv) මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමෙන් පසු අදාළ මරණ සහතික නිකුත් නොකළ තවත් පුද්ගලයන් සිටීද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

309/2024

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටේ සුභසිද්ධිය වෙනුවෙන් ජාත්‍යන්තර සම්බන්ධතා සහ අධ්‍යාපන වැඩසටහන් සඳහා 2020.08.20 සිට අද දක්වා නවවැනි පාර්ලිමේන්තුවේ කථානායකවරයා සහභාගි වූ නිල විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් විදේශ සංචාරය සඳහා සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් හා නිලධාරීන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත විදේශ සංචාරවලින් අත්පත් කර ගනු ලැබූ ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

354/2024

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2022 දෙසැම්බර් 31 දිනට —

(i) සිය අරමුදල් ආයෝජනය කිරීමෙන් සේවක අර්ථසාධක අරමුදල උපයා ඇති මුළු මුදල;

(ii) අරමුදලේ මුළු තැන්පතුවල වටිනාකම;

(iii) අරමුදල් ආයෝජනය කිරීමෙන් උපයන ලද මුළු මුදල, අරමුදලේ මුළු තැන්පතුවල වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට —

(i) සේවක අර්ථසාධක අරමුදලේ දායකයන් සංඛ්‍යාව;

(ii) සක්‍රීය දායකයන් සංඛ්‍යාව;

(iii) ඉහත සක්‍රීය දායකයන්ගේ ගිණුම් ශේෂයන්හි මුළු වටිනාකම;

(iv) අරමුදල් ආයෝජනය කිරීමෙන් උපයන ලද මුළු මුදල, සක්‍රීය දායකයන්ගේ ගිණුම් ශේෂයන්හි මුළු වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

361/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2023 ඔක්තෝබර් 01 දින වන විට —

(i) රජයේ පාසල්වල සේවය කරනු ලබන ගුරුවරුන්, ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් සහ අධ්‍යාපන පරිපාලන සේවයේ විදුහල්පතිවරුන් සංඛ්‍යාව;

(ii) ගණිතය, විද්‍යාව, තාක්ෂණය, ඉංග්‍රීසි, සෞන්දර්ය, ක්‍රීඩා සහ ප්‍රාථමික අධ්‍යාපනය යන එක් එක් විෂය සඳහා සිටිය යුතු ගුරුවරුන් සංඛ්‍යාව සහ මේ වනවිට සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව අධ්‍යාපන කලාපය අනුව;

(iii) විදුහල්පති තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අධ්‍යාපන කලාපය අනුව;

(iv) වැඩබලන විදුහල්පතිවරුන් ලෙස සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව අධ්‍යාපන කලාපය අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වැඩිම ගුරු හිඟය හා අතිරික්තය පවතින සහ වැඩිම විදුහල්පති හිඟය හා අතිරික්තය පවතින අධ්‍යාපන කොට්ඨාස විස්සේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

365/2024

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය නගා සිටුවීම සඳහා ස්ථාපිත කර ඇති රාජ්‍ය ආයතනවල නම් කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ වාර්ෂික පොල් නිෂ්පාදනයෙන් ගෘහස්ථ පරිභෝජනය, පොල් තෙල් නිෂ්පාදනය හා අපනයනය ආශ්‍රිත කර්මාන්ත යන එක් එක් අංශය සඳහා භාවිතා කරනු ලබන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2001 සිට 2020 දක්වා එක් එක් වර්ෂයේ ශ්‍රී ලංකාවේ පොල් එලදාව එක් එක් වර්ෂයට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පොල් එලදාව ඉහළ නැංවීම සඳහා ඉහත කාලය තුළදී සිදු කරන ලද වැඩසටහන් කවරේද;

(v) එම වැඩසටහන් සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

373/2024

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 වර්ෂය තුළ රිය අනතුරුවලට ලක් වී ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම අනතුරු හේතුවෙන් මරණයට පත් වූ හා තුවාල ලැබූ මගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත අනතුරු සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් විමර්ශන සිදු කර තිබේද;

(iv) එසේ නම්, එම විමර්ශනවල නිගමන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2022 වර්ෂය තුළ රිය අනතුරුවලට ලක් වී ඇති පුද්ගලික බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම අනතුරු හේතුවෙන් මරණයට පත් වූ හා තුවාල ලැබූ මගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අනතුරු අවම කර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

377/2024

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්ධන බෙදාහැරීම සඳහා ශ්‍රී ලංකාවේ ඉදිකර ඇති ඉන්ධන බෙදාහැරීමේ ප්‍රධාන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් මධ්‍යස්ථානයේ ගබඩා ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් මධ්‍යස්ථානයේ ගබඩා ධාරිතාවය අවසන්වරට වැඩි කරන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ වර්තමාන ඉන්ධන ඉල්ලුමට සාපේක්ෂව ඉහත සඳහන් මධ්‍යස්ථානවල ගබඩා ධාරිතාව පහළ මට්ටමක පවතින බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒවයේ ගබඩා ධාරිතාවය වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(iii) ඒ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) බවුසර් මඟින් ඉන්ධන ප්‍රවාහනය කිරීමට සාපේක්ෂව දුම්රිය ගැල් මඟින් ඉන්ධන ප්‍රවාහනය කිරීම ලාභදායක සහ ගැටලු අවම ක්‍රමයක් බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඉන්ධන ප්‍රවාහනය සඳහා වැඩි වශයෙන් දුම්රිය භාවිතා කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

464/2024

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— වනජීවී හා වන සංරක්ෂණ කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල පවතින කළුගල් කඩා ඉවත් කිරීමට අවසර ලබා දීමේ ගාස්තු ලෙස, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කළුගල් කඩා ඉවත් කිරීමේ ගාස්තුව 50%කින් අඩු කිරීමට තීරණය කරන ලද දිනය කවරේද;

(iii) ගාස්තු අඩු කිරීමට බලපාන ලද හේතු සාධක කවරේද;

(iv) ඒ හේතුවෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අහිමි වූ මුදල ඉහත (ii)හි සඳහන් තීරණය ක්‍රියාත්මක කරන ලද දිනයේ සිට අද දක්වා එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත (ii)හි සඳහන් තීරණය සාධාරණීකරණය කිරීමට ඇති හේතු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1220/2024

ගරු කුමාරසිරි රත්නායක මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධිලාභීන්ට සහ අඩු ආදායම්ලාභීන්ට බෙදා දීම සඳහා 2022 වර්ෂයේ මහ කන්නයේදී මොනරාගල දිස්ත්‍රික්කයේ, රජය විසින් මිලදී ගන්නා ලද වී ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා මොනරාගල දිස්ත්‍රික්කයට ලබා දෙන ලද මුදල කොපමණද;

(iii) එම මුදලින් වී මිලදී ගැනීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මිලදී ගන්නා ලද ඉහත වී සහල් බවට පත් කිරීමේදී, වී මෝල් හිමියන් විසින් එම කාර්යය සාර්ථකව ඉටුකිරීමට සමත් වී තිබේද;

(ii) එම සහල් ප්‍රතිලාභීන් වෙත බෙදා දීමේදී අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එම කාර්යය නිවැරදිව ඉටුකර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 මාර්තු 06 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

509/2024

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට විවෘත හා සීමිත තරඟ විභාග යටතේ බඳවාගන්නා ලද නිලධාරීන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව;

(ii) එම එක් එක් නිලධාරියාගේ නම, ලිපිනය සහ වර්තමාන සේවා ස්ථානය;

(iii) ඉහත නිලධාරීන් අතරින් වර්ෂ 2018 සිට මේ දක්වා ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් සංඛ්‍යාව, එම එක් එක් නිලධාරියාගේ නම, ලිපිනය සහ සේවා ස්ථානය;

(iv) ඉහත (iii)හි සඳහන් නිලධාරීන් අතරින් මේ දක්වා ස්ථාන මාරුවීම් ලබා ඇති සහ ස්ථාන මාරුවීම් ලබා නොමැති නිලධාරීන් සංඛ්‍යාව, එම එක් එක් නිලධාරියාගේ නම සහ සේවා ස්ථානය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා විදුහල්පති සේවය, ශ්‍රී ලංකා ගුරු සේවය වැනි සේවාවල මෙන් සාධාරණ ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සඳහා ක්‍රියාත්මක කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

539/2024

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනවල ඇති වාහන සංඛ්‍යාව;

(ii) එම වාහන අතරින් සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල ඇති වාහන සංඛ්‍යාව;

(iii) කුලී පදනම මත රජයේ ආයතනවලට ලබා ගෙන ඇති වාහන සංඛ්‍යාව;

(iv) කුලී පදනම මත ලබා ගෙන ඇති වාහන සඳහා ගෙවනු ලබන වාර්ෂික කුලී මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

562/2024

ගරු සංජීව එදිරිමාන්න මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ඇති පාරම්පරික කලා ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන වර්ගීකරණයකට ලක් කර තිබේද;

(iii) එසේ නම්, එම වර්ගීකරණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පාරම්පරික කලා ආයතන සඳහා මාසික දීමනාවක් ගෙවන්නේද;

(ii) එසේ නම්, එම දීමනාව කොපමණද;

(iii) මේ වනවිට එම දීමනාව ලබන පාරම්පරික කලා ආයතන සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

587/2024

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2019 සිට 2022 වර්ෂයේ පළමු කාර්තුව දක්වා එක් එක් වර්ෂය අනුව—

(i) ශ්‍රී ලංකාවේ ආදායම එක් එක් ආදායම් ප්‍රභවයන් අනුව සහ වියදම එක් එක් වියදම් ප්‍රභවයන් අනුව;

(ii) අපනයන ආදායම එක් එක් අපනයන ශීර්ෂය අනුව සහ ආනයන වියදම එක් එක් ආනයන ශීර්ෂය අනුව;

(iii) සංචාරක කර්මාන්තයෙන් උපයන ලද ආදායම;

(iv) ශ්‍රී ලංකාව ලද ණය, ආධාර සහ ප්‍රේෂණ;

ඩොලර් බිලියනවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

609/2024

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ 3ක කාලය තුළ —

(i) සුනඛයන් සපාකෑම හේතුවෙන් රජයේ රෝහල්වලින් ප්‍රතිකාර ලබා ගෙන ඇති පුද්ගලයන් සංඛ්‍යාව;

(ii) ජලභීතිකා රෝගය වැළඳීම හේතුවෙන් මියගිය පුද්ගලයන් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ආ) (i) අයාලේ යන සුනඛයන්ගෙන් මෙන්ම ගෘහ ආශ්‍රිතව සුරතලයට ඇති කරනු ලබන සුනඛයන්ගෙන්ද ජලභීතිකා රෝගය වැළඳෙන බව අනාවරණය වී තිබේද;

(ii) එසේ නම්, ජලභීතිකා රෝග ව්‍යාප්තිය අවම කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) සුරතල් සතුන් ඇති කිරීමට අදාළව නීති/රෙගුලාසි හෝ සුරතල් සතුන් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක් තිබේද;

(iv) නොඑසේ නම්, එවැනි නීති/රෙගුලාසි හෝ සුරතල් සතුන් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක් ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 මාර්තු 07 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

612/2024

ගරු ජයන්ත සමරවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1978 වර්ෂය වනවිට ශ්‍රී ලංකාවේ රජය සතුව පැවති රාජ්‍ය සංස්ථා, අධිකාරී, මණ්ඩල සහ වෙනත් නිෂ්පාදන හා සේවා ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ නම සහ කරන ලද නිෂ්පාදනය/සපයන ලද සේවාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i)හි සඳහන් ආයතන අතරින් මේ වනවිට ක්‍රියාත්මක වන ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් ආයතනයේ රජයේ හිමිකාරීත්වය ප්‍රතිශතාත්මකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) සඳහන් නිෂ්පාදන/සේවා ආයතනයන්ගෙන් පෞද්ගලීකරණය කර ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ නම, කරන ලද නිෂ්පාදනය/සපයන ලද සේවාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (අ)(i) සඳහන් ආයතන අතරින් මේ වනවිට බංකොලොත් වී ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

635/2024

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සිදු කර ඇති මනුෂ්‍ය ඝාතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇති සැකකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අතරින් නඩු පවරා ඇති සැකකරුවන් සංඛ්‍යාව කොපමණ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2023 වර්ෂය තුළ අත්අඩංගුවට ගෙන ඇති මත්ද්‍රව්‍ය ප්‍රමාණය කොපමණද;

(ii) එම මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ශ්‍රී ලංකා පොලිසිය විසින් ක්‍රියාත්මක කර ඇති "යුක්තිය" වැඩසටහනේ ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1089/2024

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වී ඇතුළු අනෙකුත් බෝගවල අස්වනු නෙලීම සඳහා යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීම මේ වනවිට ඉහළ ගොස් තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, අස්වනු නෙලීම සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍ර සූත්‍ර සම්බන්ධයෙන් නියාමනයක් සිදු කරන්නේද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී ඒ සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කෘෂි යන්ත්‍ර සූත්‍ර සඳහා අය කරනු ලබන ගාස්තු ඉහළ ගොස් ඇති බැවින් ගොවීන් දැඩි දුෂ්කරතාවයට පත් වී ඇති බව පිළිගන්නේද;

(ii) යන්ත්‍ර සූත්‍ර සඳහා ඉඩම් අක්කරයකට/වී බුසලකට අය කළ හැකි උපරිම ගාස්තුවක් නියම කිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, උපරිම ගාස්තුවක් නියම කරනු ලබන දින වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1125/2024

ගරු ඩී. වීරසිංහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් ධාවන තත්ත්වයේ පවතින බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iii) ගර්හිත බස්රථ අතරින් අලුත්වැඩියා කිරීමෙන් පසු ධාවනයට එක් කර ඇති බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iv) 'සිසු සැරිය' සේවය සඳහා ධාවනයට එක් කර ඇති බස්රථ සංඛ්‍යාව කොපමණද;

(v) වර්ෂ 2019 සිට මේ දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට මිලදී ගෙන ඇති බස්රථ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1145/2024

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර, වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංස්කෘතික මධ්‍යස්ථානය දීර්ඝ කාලයක සිට අබලන්ව ඇති බවත්;

(ii) එය අලුත්වැඩියා කිරීමට මේ දක්වා පියවර ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම සංස්කෘතික මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම අලුත්වැඩියා කටයුතු ආරම්භ කරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1149/2024

ගරු ලලිත් වර්ණ කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර, හොරණ සහ මතුගම යන එක් එක් අධ්‍යාපන කලාපයේ ඇති දෙමළ මාධ්‍ය පාසල් සංඛ්‍යාව;

(ii) එම එක් එක් අධ්‍යාපන කලාපයේ මේ වනවිට පවතින දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු සංඛ්‍යාව;

(iii) මෑතකදී විද්‍යාපීඨ ඩිප්ලෝමාධාරීන්ට ගුරු පත්වීම් ලබා දීමේදී, ඉහත සඳහන් එක් එක් අධ්‍යාපන කලාපයට පත් කරන ලද දෙමළ මාධ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සිසුන් 620ක් පමණ ඉගෙනුම ලබන කළුතර අධ්‍යාපන කලාපයේ ඇති කළු/අල්-හසනියා මහා විද්‍යාලයේ ගණිත ගුරුවරයෙකුගේ පුරප්පාඩුව ඇතුළුව මේ වනවිට ගුරු පුරප්පාඩු 15ක් පමණ පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම ගුරු පුරප්පාඩු පිරවීමට පියවර ගන්නේද;

(iii) ඉහත පාසලේ ප්‍රමාණවත් පරිදි ගොඩනැගිලි පහසුකම් නොමැති බව දන්නේද;

(iv) දානපතියන්ගේ සහයෝගයෙන් ඉදිකරමින් පවතින පන්ති කාමර 12කින් යුත් තෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු මේ වනවිට අවසන් අදියරේ පවතින බව දන්නේද;

(v) එම පන්ති කාමර 12 සඳහා මේස හා පුටු ලබා දීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1151/2024

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්මිරිස්, කරාබුනැටි, එනසාල් සහ කුරුඳු වැනි සුළු අපනයන භෝග වගාව ග්‍රාමීය මට්ටමින් ප්‍රවර්ධනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඉදිරියේදී සුළු අපනයන භෝග වගාව ප්‍රවර්ධනය කරනු ලබන ප්‍රදේශ කවරේද;

(iii) සුළු අපනයන භෝග සඳහා පොහොර ලබා දීමට වැඩපිළිවෙළක් තිබේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(v) සුළු අපනයන භෝග ගම්මාන ස්ථාපිත කිරීමේ වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1246/2024

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වසරේ ශ්‍රී ලංකාවේ පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධයෙන් 'චැනල් 4' නාලිකාව විසින් එල්ල කරන ලද චෝදනා සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පත් කළ ජනාධිපති කොමිසමේ ප්‍රගතිය;

(ii) ඉහත කොමිෂන් සභා වාර්තාව මෙම සභාවට සහ මහජනතාවට ලබා දෙනු ලබන දිනය; සහ

(iii) එම විමර්ශනයේ ප්‍රගතියක් නොමැති නම් ඊට හේතු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රහාර සම්බන්ධයෙන් 'චැනල් 4' නාලිකාව විසින් එල්ල කරන ලද එම චෝදනා විමර්ශනය කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීමට හේතු;

(ii) ඉහත කාරක සභාවේ ප්‍රගතිය;

(iii) ප්‍රගතියක් නොමැති නම්, ඊට හේතු; සහ

(iv) ඉහත කමිටුවේ පරාමිතීන්;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එකී ප්‍රහාර සම්බන්ධයෙන් ස්වාධීන ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට කරන ලද ඉල්ලීම් රජය දිගින් දිගටම නොසලකා හැර තිබීමට හේතු කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1251/2024

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා සම්බන්ධයෙන් කර ඇති නිරීක්ෂණ හා නිර්දේශ කවරේද;

(ii) ඔහු පොලිස් පරිපාලන අංශ ප්‍රධානි තනතුරට පත් කරන ලද දිනය, එම තනතුර සඳහා ඔහු නිර්දේශ කරන ලද දිනය සහ එම තනතුරට ඔහු නිර්දේශ කරන ලද පුද්ගලයන්ගේ හා ආයතනවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇති ඉහත නිලධාරියා එම තනතුරට පත් කිරීම සඳහා බලපෑ සාධක කවරේද;

(iv) ඉහත පත් කිරීම, නැවත සලකා බැලීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1280/2024

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා මොනරාගල දිස්ත්‍රික්කයේ මුළු විදුලි පාරිභෝගිකයන් සංඛ්‍යාව සහ විදුලිය විසන්ධි කරන ලද විදුලි පාරිභෝගිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) විදුලිය විසන්ධි කිරීමෙන් පසුව නැවත සම්බන්ධතාවය ලබා දීමෙන් ලංකා විදුලිබල මණ්ඩලය උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) විදුලිය ඒකකයක මිල සම්බන්ධයෙන් ගැනීමට අපේක්ෂිත ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2024 මැයි 10 සිකුරාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 1/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— ආක්‍රමණික පැළෑටි හා සතුන් හේතුවෙන් ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි විය හැකි ආක්‍රමණික පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම්කිරීම මඟින් එම පැළෑටි හා සතුන් බෝ කිරීම හා ආනයනය කිරීම තහනම් කර ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී කඩිනමින් අවශ්‍ය නීති සම්පාදන කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 2/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල ශිෂ්‍ය/ශිෂ්‍යාවන් විසින් කරනු ලබන පර්යේෂණ නිබන්ධන අදාළ අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කරගනිමින් සකස් කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට පවතින විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලබන සිසුන් විසින් හදාරනු ලබන පාඨමාලා සම්බන්ධයෙන් සිදු කරනු ලබන පර්යේෂණ නිබන්ධන ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික වර්ධනයට අදාළව සිදු කිරීම වැදගත් වන හෙයින් ද, මෙම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරුන් හා එකී පර්යේෂණ නිබන්ධනවලට අදාළ අමාත්‍යාංශය අතර මනා සම්බන්ධීකරණයක් සිදු කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශ මට්ටමින් වගකිව යුතු නිලධාරියකු පත් කළ යුතු හෙයින් ද, අදාළ අමාත්‍යාංශයන් හි ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සිදු කිරීමේ දී දිගුකාලීන, මධ්‍යකාලීන සහ කෙටිකාලීන ඉලක්ක සපුරා ගැනීම සඳහා එකී නිබන්ධන යොදා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.3/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— ලොව පුරා ඇති බෞද්ධ සිද්ධස්ථාන රැක ගැනීමට පෙරමුණ ගැනීම,— ලොව පුරා සිටින බෞද්ධයන්ගේ වන්දනාවට පාත්‍රවන බෞද්ධ සිද්ධස්ථානවල ආරක්ෂාව තර කිරීමට හා අන්තර්ජාතික වශයෙන් බෞද්ධයන් වෙනුවෙන් හඬක් නැඟිය හැකි ශක්තිමත් සංවිධානයක් ගොඩනැඟීම සඳහා ලොව පුරා සිටින බෞද්ධ නායකයන් හා සංවිධාන ඒකරාශී කිරීමට ශ්‍රී ලංකාව මූලිකත්වය ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල දිවයින පුරා ව්‍යාප්ත කිරීම,— ජීවිතයේ සැඳෑ සමය ගත කරමින් සිටින වැඩිහිටියන්ට තම පවුලේ සාමාජිකයන්ගෙන් මෙන්ම ඇතැම් ආයතනවලින් නොසලකා හැරීම් නිසා සිදුවන විවිධ අසාධාරණ සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩපිළිවෙළ පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය ඔස්සේ අළෙවි කිරීම මඟින් සිදු කරන ඖෂධ ජාවාරම මැඩපැවැත්වීම,— වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවණ්‍ය නිෂ්පාදන විශාල ලෙස අළෙවි කරන බැවින් ද, මෙය අප රටේ ජනතාවගේ ජීවිතාරක්ෂාවට විශාල තර්ජනයක් වන බැවින් ද, මෙම තත්ත්වය මැඩපවත්වා ගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් රජය විසින් සකසා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— ණය ක්‍රමයක් මඟින් වැඩිහිටි ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවෙහි ජීවනෝපාය මාර්ග ශක්තිමත් කර දීමෙන් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ඔවුන්ව දායක කර ගත හැකි වන හෙයින් ද, මෙම වැඩිහිටි ප්‍රජාව සඳහා බැංකු පද්ධතිය මඟින් ණය පහසුකම් ලබා නොදීම හේතුවෙන් ඔවුන්ට සමාජය තුළ වෙනස්ව සැලකීමක් සිදුවන හෙයින් ද, බැංකු පද්ධතිය මඟින් වයස අවුරුදු 60 ඉක්මවන්නන් හට ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.9/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ඉතිහාසය පිළිබඳ ග්‍රන්ථයක් එළිදැක්වීම,— මානව පරිණාමයේ සිට පුරාවිද්‍යාව, සාහිත්‍යය, ජනශ්‍රැතිය, රෝම, ග්‍රීක හා පර්සියානු ඉතිහාසය අධ්‍යයනය කොට ශ්‍රී ලාංකික ඉතිහාසය පිළිබඳ ග්‍රන්ථයක් ප්‍රවීණ කර්තෘ මණ්ඩලයක් යටතේ රාජ්‍ය අනුග්‍රහයෙන් එළිදැක්වීමට රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.10/2024

ගරු හේෂා විතානගේ මහතා,— ආගමික අන්තවාදය වැළැක්වීමේ අවශ්‍යතාවය,— කවර රටක කවර ක්ෂේත්‍රයක වුව ද අන්තවාදී අදහස් තිබීම ඉතා හානිකර වන හෙයින් ද, ආගමික අන්තවාදය පිළිබඳව පසුගිය පාස්කු ප්‍රහාරයෙන් පසුව සමාජයේ විශාල කථිකාවතක් ඇති වී තිබෙන හෙයින් ද, ආගමික අන්තවාදය මතුවීම හා ප්‍රවර්ධනය කිරීම වැළැක්වීම සහ එයට දැනටමත් ගොදුරු වී සිටින පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.11/2024

ගරු හේෂා විතානගේ මහතා,— රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම,— රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ප්‍රතිලාභ රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නොව බදුල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ජනතාවට ද ලැබෙන හෙයින් රටේ පවතින ආර්ථික දුෂ්කරතා හමුවේ වුව ද විශාල ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමට හැකියාව ඇති මෙම ව්‍යාපෘති අඛණ්ඩව කොටස් වශයෙන් හෝ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.12/2024

ගරු හේෂා විතානගේ මහතා,— කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබා දෙන දුම්රිය මාර්ගයක් ලෙස කැලණිවැලි දුම්රිය මාර්ගය සළකනු ලබන හෙයින් ද, මෙම දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම තුළින් එහි ප්‍රතිලාභ රත්නපුර, හම්බනේතාට සහ බදුල්ල ඇතුළු දිස්ත්‍රික්ක රැසක ජනතාවට භුක්ති විඳිය හැකි වන හෙයින් ද, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/2024

ගරු හේෂා විතානගේ මහතා,— කඩා වැටුණු මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම,— රටක ආර්ථික සංවර්ධනය හා මූල්‍ය වෙළඳපොළ කෙරෙහි සුවිශේෂී බලපෑමක් මූල්‍ය ආයතන හරහා සිදුවුවත්, පසුගිය කාලය පුරා මෙරට මූල්‍ය ආයතන කිහිපයක් කඩා වැටීමකට ලක් වී ඇති හෙයින් ද, එහි තැන්පතුකරුවන් පොදුවේ ප්‍රශ්න රාශියකට මුහුණ පා සිටින හෙයින් ද, එම මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/2024

ගරු හේෂා විතානගේ මහතා,— දේශීය ටින්මාළු නිෂ්පාදනය වැඩි කිරීම,— ශ්‍රී ලංකාව වටා මුහුද තිබියදී රටට අවශ්‍ය ටින්මාළු ආනයනය සඳහා වාර්ෂිකව විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී යන හෙයින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය ටින්මාළු කර්මාන්තය දියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට රජය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/2024

ගරු හේෂා විතානගේ මහතා,— පළාත් පාලන ආයතනවල අබලන් වූ වාහන අලුත්වැඩියා කිරීම,— පළාත් පාලන ආයතන බොහොමයකම අබලන් තත්ත්වයේ පවතින වාහන ගාල් කර ඇති ආකාරය ඉතා සුලභ දසුනක් වන හෙයින් ද, එම ආයතන සඳහා අලුතින් වාහන මිල දී ගැනීම වෙනුවට එම වාහන අලුත්වැඩියා කිරීම තුළින් විශාල මුදලක් ඉතිරි කර ගත හැකි හෙයින් ද, පළාත් පාලන ආයතනවල අබලන් වී ඇති වාහන අලුත්වැඩියා කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2024

ගරු හේෂා විතානගේ මහතා,— විදේශගත ශ්‍රමිකයන්ට සුබසාධනය සැලසීම,— ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය ලබාදීමට උරදෙන විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල්වල සුබසාධනය සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2024

ගරු හේෂා විතානගේ මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී සිසු සිසුවියන් ලබා ගන්නා Z- අගය (Z- Score) මත සියලුම රාජ්‍ය අංශයේ රැකියා පුරප්පාඩු පිරවීම,— රාජ්‍ය සේවයට බඳවාගැනීමේ දී පැවති හා පවත්නා ආණ්ඩු විසින් දේශපාලන පක්ෂපාතීත්වය මත හෝ රුචි අරුචිකම් මත අනුගමනය කරන ලද ප්‍රතිපත්ති රාජ්‍ය සේවයේ ස්වාධීනත්වයට බරපතල හානියක් සිදු කර ඇති හෙයින් ද, ඒ හේතුවෙන් දැඩි දේශපාලනීකරණයට ගොදුරු වී ඇති රාජ්‍ය සේවය මුළුමනින්ම ස්වාධීන කර ගැනීමට අවශ්‍ය වන හෙයින් ද, අධ්‍යාපන සුදුසුකම් මත පමණක් රැකියා ලබා දීමේදී දක්ෂ හා සුදුසුකම් සහිත දරුවන්ට යුක්තිය හා සාධාරණත්වය ඉටුවන බැවින් තරුණ අසහනය මුලිනුපුටා දැමීමට ඉන් හැකිවන හෙයින් ද, දිස්ත්‍රික්කය තුළ ඇතිවන පුරප්පාඩු අදාළ දිස්ත්‍රික්කය තුළ පදිංචිකරුවන්ට හිමිවීම හරහා රැකියාලාභීන්ගේ ආර්ථික සුරක්ෂිතතාව මෙන්ම ඉහළ කාර්යක්ෂම සේවාවක් රාජ්‍ය අංශයට ලබා ගැනීමට අවකාශ උදාවන හෙයින් ද, සියලුම රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා, අධිකාරි, මණ්ඩල සහ පළාත් සභා අනුබද්ධ සියලු ආයතනයන් හි රැකියා පුරප්පාඩු පිරවීම සඳහා අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී සිසු සිසුවියන් ලබා ගන්නා Z- අගය සැලකිල්ලට ගැනීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 'බ්‍රේල්' ක්‍රමයට හා 'ශ්‍රවණ' (Audio) ආකාරයට සකස් කිරීම,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඕනෑම රටක මූලික නීතිය හා රාජ්‍යයේ මූලික ආකෘතිය වන හෙයින් ද, මිලියන විසිදෙකකට ආසන්න වූ ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් මිලියන දෙකකට ආසන්න ප්‍රමාණයක් ආබාධ සහිත ප්‍රජාව වන හෙයින් ද, ආබාධ ප්‍රජාව අතරින් ද ලක්ෂ හයකට ආසන්න ප්‍රමාණයක්

ශ්‍රවණාබාධ සහ දෘශ්‍යාබාධ සහිත පුරවැසියන් වන හෙයින් ද, රටේ මූලික නීතිය පිළිබඳ දැනීමක් හා අවබෝධයක් ලබාගැනීම සඳහා මෙම ශ්‍රවණ සහ දෘශ්‍යාබාධ සහිත ප්‍රජාව සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 'බ්‍රේල්' ක්‍රමයට හා 'ශ්‍රවණ' (Audio) ආකාරයට සකස් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— 50% බැගින් ජාතික කුසලතාවට අදාළව සහ පාසැල් පදනමට අදාළව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසු සිසුවියන් තෝරා ගැනීමේ දර්ශකය වන Z-අගය (Z- Score) ගණනය කිරීම,— අ.පො.ස. උසස් පෙළ සමත් සිසු සිසුවියන් අතරින් කලා පීඨ හැර අනෙකුත් විශ්වවිද්‍යාල පීඨ සඳහා සිසුන් බඳවා ගැනීමේ පදනම හා දර්ශකය Z-අගය මත සකස් කර ඇති හෙයින් ද, මෙම ක්‍රමවේදයට අනුව Z-අගයෙන් 40% ක් ජාතික කුසලතාව (national Merits) මත පදනම්ව ද 55% ක් දිස්ත්‍රික් පදනම (district basis) මත පදනම්ව ද 5% ක් අති දුෂ්කර දිස්ත්‍රික්ක (remote districts) මත පදනම්ව ගණනය කරනු ලබන හෙයින් ද, ඕනෑම දිස්ත්‍රික්කයක ඇති සියලුම පාසැල් සඳහා සමාන ලකුණු මට්ටමක් හෝ අගයක් ආදේශ කිරීම යුක්ති සහගත හෝ සාධාරණ නොවන හෙයින් ද, දිස්ත්‍රික්ක හා අති දුෂ්කර දිස්ත්‍රික්ක පදනම වෙනුවට පාසැල් පදනම වශයෙන් ආදේශ කොට පාසැල් පද්ධතිය තුළ ඇති උසස් පෙළ විෂය ධාරාවන් සහිත පාසැල් තුන්දහස් හතලිස් දෙක (3042) කාණ්ඩ කිහිපයකට වර්ගීකරණය කොට විශ්වවිද්‍යාල ජාතික කුසලතාවට අනුව 50% ක් ද පාසැල් පදනමට අදාළව 50% ක් ද වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා Z-අගය ගණනය කිරීමට රජය විසින් පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— පුද්ගල නාමකරණය ප්‍රසිද්ධියේ ශබ්ද නගා සිදු කරන අවස්ථාවලදී මුල් නම සමඟ වාසගමේ මූලික සංකේත අකුරු හෝ ජාතික හැඳුනුම්පත් අංකය පමණක් සඳහන් කිරීම,— ශ්‍රී ලාංකික සිංහල සමාජයේ පුද්ගල නාමකරණයේ දී වාසගම බොහෝවිට යෙදී ඇත්තේ වැඩවසම් සමාජය තුළ තිබූ රාජකාරි සහ රාජ මෙහෙවරට පසුබිම්ව වන හෙයින් ද, ඇතැම් වාසගම් යෙදී ඇත්තේ මෙම රාජකාරිවලට අදාළ කුලය ඉස්මතු වන හෙයින් ද, අධිකරණ කටයුත්තකට හෝ මැතිවරණයක දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්ද දායකයා කැඳවන විටදී හෝ විශ්වවිද්‍යාල උපාධි ප්‍රදානෝත්සවයක දී උපාධි අපේක්ෂකයා කැඳවන විට දී හෝ පුද්ගල නාමකරණය ප්‍රසිද්ධියේ ශබ්ද නගා සිදු කරන අවස්ථාවලදී මුල් නම සමඟ වාසගම ශබ්ද නගා ප්‍රකාශ කිරීම හේතුවෙන් බොහෝ පුද්ගලයන් දැඩි අපහසුතාවයට පත්වන හෙයින් ද, වර්තමාන පරම්පරාව විසින් ප්‍රතික්ෂේප කරන නූතන ලෝකයට ආදේශ කළ නොහැකි මෙම නීතිය, සිරිත හෝ සම්ප්‍රදාය ඉවත් කොට ජනතාව ඉදිරියේ පුද්ගල නාමකරණය ප්‍රසිද්ධියේ ශබ්ද නගා සිදු කරන අවස්ථාවලදී මුල් නම සමඟ වාසගමේ මූලික සංකේත අකුරු හෝ ජාතික හැඳුනුම්පත් අංකය පමණක් සඳහන් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යාපීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දියුණු ජාත්‍යන්තර තලයට ගෙන යාම උදෙසා 2023 වර්ෂය වනවිට පාසැල් පද්ධතියේ සියලුම ගුරුවරුන් පුහුණු උපාධිධාරී ගුරුවරුන් බවට පත් කිරීමට අවශ්‍ය වන හෙයින් ද, වර්තමානයේ

බහුතරයක් ගුරුවරුන් හට තෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලාවක් අවසානයේ උසස් ඩිප්ලෝමාවක් හිමිවන හෙයින් ද, වසර තුනක න්‍යායාත්මක පාඨමාලාවක් සහ එක් වසරක පාසැල් කේන්ද්‍රීය පුහුණුවක් සහිත සිව් වසරක උපාධි පාඨමාලාවක් ප්‍රදානය කිරීම සඳහා උචිත වන සේ දැනට ක්‍රියාත්මක අධ්‍යාපන විද්‍යාපීඨ දහනවය විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීමට අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් 2020 පෙබරවාරි 13 දින මවිසින් ඉදිරිපත් කොට අනුමතිය ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— සියලුම මහජන නියෝජිත ආයතනවලට නියෝජිතයන් තෝරා පත් කර ගැනීමේ දී අවම වශයෙන් 5% ක නියෝජනයක් ආබාධ සහිත පුරවැසියන්ට ලබා දීම,— ශ්‍රී ලංකාවේ අවසන් වරට පවත්වනු ලැබූ ජන සංගණනයට අනුව මෙරට ආබාධ සහිත ප්‍රජාව මුළු ජනගහනයෙන් 8% ඉක්මවා ගොස් ඇති හෙයින් ද, ග්‍රාමීය පරිපාලනය සිදුවන පළාත් පාලනයේ සිට ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලබන පාර්ලිමේන්තුව දක්වා මහජන නියෝජිත ආයතනවලට ආබාධ සහිත ප්‍රජාව තේරී පත්වීමට අල්ප අවකාශයක් හිමි ව ඇති හෙයින් ද, ආබාධ සහිත මෙරට පුරවැසියන්ට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය සිදුව ඇත්තේ ද සිදුවන්නේ ද දියුණු රටවල සංකල්පවලට අනුව නොවන හෙයින් ද, සියලුම මහජන නියෝජිත ආයතනවලට නියෝජිතයන් තෝරා පත් කර ගැනීමේ නාම යෝජනා සැකසීමේ දී අවම වශයෙන් 5% ක නියෝජනයක් ආබාධ සහිත පුරවැසියන්ට හිමිවන සේ රජය විසින් අදාළ පනත් හා නීති සංශෝධනය කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන හෝ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවකාශ සලසා දීම,— ශ්‍රී ලංකාවේ ඕනෑම ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ මූලික අධ්‍යාපන සුදුසුකම් හෝ Z- අගය මත පදනම් නොවී ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය නෛතික හා උසස් අධ්‍යාපනික ව්‍යුහය රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— නිල්වලා ගඟ සංවර්ධන ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම,— 1980 දශකයේ දී ආරම්භ කරන ලද නිල්වලා ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සම්පූර්ණ කිරීමට නොහැකිවීම හේතුවෙන් මාතර දිස්ත්‍රික්කයේ හා නිල්වලා නිම්නයේ ජීවත්වන ජනතාවගේ දෛනික ජීවිතය හා ආර්ථිකය බරපතල අර්බුදයකට පත්වී ඇති හෙයින් ද, ඌරුබොකු ඔය සහ කිරම ආර හම්බන්තොට ශුෂ්ක කලාපයට හැරවීම, පහළ නිම්නයේ බටුවිට ජලාශය, අතුරලිය ජලාශය, කඩවැද්දුව ජලාශය සහ දෙදියගල ජලාශය නිර්මාණය කිරීම සහ ආරක්ෂිත කලාපය හා අනාරක්ෂිත කලාප පිළිබඳ නැවත අධ්‍යයනය කොට අත්හරින ලද වේලි (bunts) නැවත ඉදිකිරීම ප්‍රමුඛ කොටගත් මාතර හා හම්බන්තොට ප්‍රදේශවලට සෘජුවම බලපාන නිල්වලා ගඟ සංවර්ධන ව්‍යාපෘතියේ මූලික සැලසුම් රජය විසින් කඩිනමින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 26/2024

ගරු සජිත් ප්‍රේමදාස මහතා
ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා
ගරු ජේ. සී. අලවතුවල මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු කබීර් හෂීම් මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු උදය ගම්මන්පිල මහතා
ගරු තිස්ස අත්තනායක මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහජන සුභසිද්ධිය සැලසීම සඳහා වන ආණ්ඩුවේ පරම යුතුකමත්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නීතිරීතිවලටත් පටහැනිව ලංකා විදුලි බල මණ්ඩලය විසින් සිදු කරනු ලැබූ විදුලි ගාස්තු සංශෝධනය සහ එයට 'අනුමතය' ලබා ගැනීම යන කරුණු පිළිබඳව සොයා බැලීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 ව්‍යවස්ථාව මඟින් පරමාධිපත්‍ය බලය පවරා දී ඇති ශ්‍රී ලංකාවේ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා විදුලිය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදාහැරීම, සැපයීම සහ භාවිතය 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත මඟින් නියාමනය කෙරෙන අතර, නීතිය මඟින් ස්ථාපිත පොදු අධිකාරීන් මඟින් ක්‍රියාත්මක කෙරෙන හෙයින් ද;

ශ්‍රී ලංකා විදුලිබල පනතේ 2 වගන්තිය මඟින් පනතේ විධිවිධාන පරිපාලනය කිරීමේ කාර්යය 2002 අංක 35 දරන පනත මඟින් ස්ථාපිත මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත පවරා ඇති අතර,

'ස්වකීය පාරිභෝගිකයන්ට වඩාත් ලාභදායක සහ කාර්යක්ෂම සේවයක් ලබාදීම සහතික කිරීමේ අරමුණින් බලපත්‍රලාභීන් හා වෙනත් විදුලිබල ව්‍යාපාරවලින් අයකරනු ලබන ගාස්තු සහ වෙනත් අයකිරීම් නියාමනය කිරීම' ශ්‍රී ලංකා විදුලිබල පනතේ 3(1) (ඇ) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කර්තව්‍යය වන බැවින් ද, රජය විසින් සම්පාදනය කරනු ලබන මෙම අත්‍යවශ්‍ය මහජන උපයෝගිතාවන් හි අවසන් ප්‍රතිලාභීන් බවට පත්විය යුත්තේ සෑම කල්හිම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පරමාධිපත්‍ය බලය පවරා දී ඇති ජනතාව වන හෙයින් ද;

එකී පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයන් අමාත්‍යවරයා විසින් පත් කළ හැකි වනුයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟතාවය සහිතව පමණක් වන අතර, 6 වගන්තිය ප්‍රකාරව සාමාජිකයන් පාර්ලිමේන්තුව විසින් සෘජුව ක්‍රියාත්මක කරනු ලබන විනය පාලනයට යටත්වන බවට වූ විධිවිධාන මඟින් මහජන උයෝගිතා කොමිෂන් සභාවේ ස්වාධීනත්වය සහතික කරනු ලැබ ඇති හෙයින් ද;

2023.05.24 දින ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සභාපතිවරයා ඉවත් කිරීම සඳහා ගෙන එන ලද යෝජනාව විවාදයට ගනු ලබන අවස්ථාවේ දී සභාගත කරන ලද ලේඛනවලට අනුව විදුලිය බෙදාහැරීම සම්බන්ධ බලපත්‍රලාභී රජයේ සංස්ථාවක් වන ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම) විසින් 2023.01.05 දිනැති ලිපිය මඟින් ගාස්තු සංශෝධනයක් සඳහා කොමිෂන් සභාවේ අනුමතය අපේක්ෂා කරන ලද අතර, ඒ අනුව කොමිෂන් සභාව විසින් ජාතික පුවත්පත් 3 ක දැන්වීම් පළකරමින් පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීමක නිරතවීම සඳහා තීරණය කොට ලං.වි.ම. වෙතින් කරුණු පැහැදිලි කිරීම් ගණනාවක් ඉල්ලා සිටි හෙයින් ද;

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සභාපතිවරයා ලංකා විදුලිබල මණ්ඩලය විසින් යෝජනා කරන ලද විදුලි ගාස්තු වැඩිකිරීම ලංකා විදුලිබල මණ්ඩලය යෝජනා කර ඇති ආකාරයට අවශ්‍ය නොවන බවට දිගින් දිගටම ප්‍රකාශ කරන ලද හෙයින් ද;

2023.02.08 දින නියෝජ්‍ය සභාපතිවරයා ද ඇතුළත්ව කොමිෂන් සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු ඉල්ලා අස්වූ අතර, 2022 ඔක්තෝබර් මාසයේ දී අග්‍රාමාත්‍යවරයා වෙතින් ලබාගත් නිවාඩු අනුමතයකට අනුව 2023.02.13 දින සිට 2023.02.27 දින දක්වා සභාපතිවරයා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටි හෙයින් ද;

(පෙර සිට පැවැති පුරප්පාඩුවක් සඳහා) 2023.02.02 දින හා (2023.02.08 දින ඉල්ලා අස්වීමෙන් ඇති වූ පුරප්පාඩුවක් සඳහා) 2023.02.13 දින ලෙස දෙදිනක දී කොමිෂන් සභාවට නව සාමාජිකයන් දෙදෙනෙකු පත්කරන ලද හෙයින් ද;

අලුතින් පත්කළ සාමාජිකයන් දෙදෙනා ද ඇතුළත්ව කොමිෂන් සභාවේ සාමාජිකයින් තිදෙනෙකු ලං.වි.ම. විසින් ඉල්ලා සිටින ලද සමස්ත ගාස්තු සංශෝධනය ‘අනුමත කිරීම’ ට යැයි පවසමින් 2023.02.14 දින රැස්වී ඇති බව පෙනී යන අතර, ගාස්තු සංශෝධනය ‘අනුමත කරන ලද’ බව කොමිෂන් සභාවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලං.වි.ම. වෙත දැනුම්දුන් අතර, කොමිෂන් සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු විසින් ද ලිපිය අත්සන් කරනු ලැබ කොමිෂන් සභාවේ නිල මුද්‍රාව ද තබන ලද හෙයින් ද;

කොමිෂන් සභාවේ රැස්වීමක් කැඳවිය යුත්තේ සභාපතිවරයා විසින් වන බවට 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ 9(1) වගන්තිය මඟින් නිශ්චිත වශයෙන්ම පනවා ඇති අතර, කොමිෂන් සභාව විසින් පාර්ශවකරුවන්ගේ අදහස් විමසීමක් සිදු කරමින් පවත්නා අතරතුර ජනතාව වෙත බරපතල ලෙස බලපාන්නා වූ ගාස්තු සංශෝධනයක් වැනි තීරණාත්මක කාරණයක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලයක් සාමාජිකයන් තිදෙනා වෙත නොපැවැති යුතු හෙයින් ද;

කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මුලසුන සභාපතිවරයා විසින් දැරිය යුතු අතර, සභාපතිවරයා නොමැති අවස්ථාවන්හි නියෝජ්‍ය සභාපතිවරයා විසින් එම රැස්වීම්වල මුලසුන දැරිය යුතු බවට 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ 9(3) වගන්තිය මඟින් විධිවිධාන සලසා ඇති අතර, සභාපතිවරයා රටතුළ නොසිටි හා නියෝජ්‍ය සභාපතිවරයා ඉල්ලා අස්වී තිබූ බැවින් එසේ පැවැත්වූයේ යැයි පැවසෙන රැස්වීමෙහි මුලසුන කිසිවෙකු විසින් හෝ දැරිය නොහැකිව තිබූ හෙයින් ද;

ලිඛිතව දැක්විය යුතු හේතු කාරණා මඟින් කොමිෂන් සභාවේ සියලු තීරණ සාධාරණීකරණය විය යුතු බවට 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ 9(6) වගන්තිය මඟින් විධිවිධාන සලසා ඇති අතර, 'අනුමතය' ලබාදුන් බවට පැවසෙන එකී ලිපිය තුළ කිසිදු හේතු දැක්වීමක් අන්තර්ගත නොවන අතර, ඒ අනුව එය ආරම්භයේ පටන්ම බල රහිත ලිපියක් වන හෙයින් ද;

කොමිෂන් සභාවේ නිල මුද්‍රාව 'කොමිෂන් සභාවේ අනුදැනුම ඇතිව හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු' බවට 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ 10(ඇ) වගන්තිය මඟින් නිශ්චිත වශයෙන් විධිවිධාන සලසා ඇති අතර, පනතේ 3(1) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාව සාමාජිකයන් පස්දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, එකී 'රැස්වීමේ' සාකච්ඡා සටහන්, කොමිෂන් සභාවේ සාකච්ඡා සටහන් පොතේ ඇතුළත් කොට නොමැති බැවින් 'රැස්වීම' පැවැතියේ කවර ස්ථානයක ද හා එම ක්‍රියාවලියට පැමිණ සිටි හා සහභාගි වූ පුද්ගලයන් කවුරුන් ද යන කරුණු පිළිබඳ පැහැදිලිතාවයක් නොපවත්නා හෙයින් ද;

(i) පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව රැස්වීම සභාපතිවරයා විසින් නොකැඳවන ලද අතර, පනතේ විධිවිධාන හා අනුගතව නොපැවැත්වීම;

(ii) පනතේ 9(6) වගන්තිය ප්‍රකාරව හේතු දැක්වීම් මඟින් එකී තීරණය සාධාරණීකරණය වී නොමැති වීම;

(iii) කොමිෂන් සභාවේ අධිකාරිය සහිතව 'අනුමතය' ලබා දුන් බවට හැඟීමක් ඇති කරනු පිණිස පනතේ 10(ඇ) වගන්තියට පටහැනිව කොමිෂන් සභාවේ නිල මුද්‍රාව යොදා ඇති අතර, ඒ අනුව දණ්ඩනීති සංග්‍රහයේ 453 වගන්තිය තුළ අර්ථ නිරූපිත පරිදි එම ලේඛනයම ව්‍යාජ ලේඛනයක් වන අතර, දණ්ඩනීති සංග්‍රහයේ 454 වගන්තිය ප්‍රකාර එය කූට ලේඛන සකස් කිරීමක් සේ සලකා දඬුවම් ලැබිය යුතු කරුණක් වන අතර, එයට අනුබල දීම හේතු කොට එම ක්‍රියාවලියට පැමිණ සිටි හා සහභාගි වූ අය කූට ලේඛන සකස් කිරීමේ වරද සිදුකිරීමේ කුමන්ත්‍රණයට වැරදිකරුවන් වීම;

යන කරුණු සැලකිල්ලට ගැනීමේ දී ලං.වි.ම. විසින් ඉල්ලා සිටින ලද සමස්ත ගාස්තු සංශෝධනය අනුමත කළේ යැයි පැවසෙන සාමාජිකයන් තිදෙනාගේ 'රැස්වීම' වලංගු නොවූ තත්ත්වයක පවත්නා අතර, කොමිෂන් සභාවේ රැස්වීමක් නොවන හෙයින් ද;

පරිභෝජනය කරනු ලබන විදුලි ඒකක ප්‍රමාණය මත පදනම්ව ස්ථාවර ගාස්තුවක් ද සමස්ත ගාස්තුව මත විශේෂ සේවා බද්දක් ද වශයෙන් ලං.වි.ම. විසින් මේ වනවිට තියුණු ලෙස ඉහළ දමන ලද ගාස්තු ප්‍රමාණයන් අයකරන අතර, එය සත්‍ය වශයෙන්ම පරිභෝජනය කරනු ලබන විදුලිය ප්‍රමාණය මත තුන් ගුණයක අය කිරීමක් වන බැවින් එමඟින් 1138% ක ගාස්තු වැඩිවීමකට යටත්කොට ඇති මිලියන 1.5 ක පාරිභෝගික සංඛ්‍යාවක් ඇතුළත්වන, මාසිකව ඒකක 35 කට වඩා අඩුවෙන් පරිභෝජනය කරන අන්ත දුගී කොටස් විශේෂ කොටගෙන පාරිභෝගිකයන් මත බරපතල බලපෑමක් ඇති කරන ලද අතර, එය දුප්පතුන් අඳුරේ හෙළන පියවරක් වශයෙන් හැඳින්විය හැකි හෙයින් ද;

පාර්ලිමේන්තුවට රජයේ මුදල් පිළිබඳ පූර්ණ පාලන බලය පවරන්නා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාව හා කොමිෂන් සභාව අවසන් වශයෙන් පාර්ලිමේන්තුවට පිළිතුරු ලබා දිය යුතු බවට පනවන 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ විධිවිධානවල සඳහන්ව ඇති හෙයින්ද;

ඊට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 74(1) ව්‍යවස්ථාව ප්‍රකාර පාර්ලිමේන්තුව විසින්,

(අ) ලංකා විදුලිබල මණ්ඩලය විසින් මේ වන විට අයකරනු ලබන ගාස්තු සංශෝධනය 'අනුමතය' ට අදාළ නිත්‍යානුකූලභාවය හා උචිත බව විමසා බලා, යම්කිසි ආකාරයකට නිත්‍යානුකූල නොවන බවක් හා/හෝ උචිත නොවන බවක් හඳුනාගතහොත්, එයට වගකිවයුත්තන්ට එරෙහිව ගත යුතුවන ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහා; සහ

(ආ) කොමිෂන් සභාව අක්‍රිය වී තිබූ බැවින්, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ විධිවිධානවලට පටහැනිව එකී 'අනුමතය' ලබා දී ඇති බවට හඳුනාගත හොත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශිත පිරිවැය පියවා ගැනීමේ මාර්ගෝපදේශ හා 2008.10.22 දිනැති අංක SCFR 113/2008 දරන ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව සැලකිල්ලට ගනිමින් 'පහළ අන්තයේ' පාරිභෝගිකයන්, ගෘහස්ත, ආගමික හා පුණ්‍යායතන පාරිභෝගිකයන් වෙත සහන සලසමින්, ගාස්තු ව්‍යුහයක් ද ඇතුළත්ව පොදු යහපත උදෙසා පාර්ලිමේන්තුව විසින් ගත යුතුව පවත්නා හදිසි ප්‍රතිකර්මක ක්‍රියාමාර්ග නිර්දේශ කිරීමටත්,

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවේ සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් පත්කළ යුතුය; සහ

(ආ) ස්ථාවර නියෝග 101 හි විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් විසිඑක් දෙනෙකුගෙන් (21) සමන්විත විය යුතුය.

3. එම කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද,

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව ලබා ගැනීමට ද,

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතුය.

4.කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස තුනක (03) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළතදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.